Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# *දියර කිරි නිෂ්පාදන කර්මාන්තය ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කිරීමට දක්වන දායකත්වය (කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින්)*


**කේ.එච්.ආර්. රණසිංහ1**

**යූ. ඒ. චන්ද්‍රසේන2**



සංක්ෂේපය

ඈත අතීතයේ සිටම කෘෂිකාර්මික රටක් වූ නිසා ඊට සමගාමීව දිවයිනේ නගරයෙන් බැහැරව පිහිටි සෑම ගමකම, සෑම පවුලකම පාහේ සාම්ප්‍රදායික වශයෙන් ගවයන් කිහිපදෙනෙකු ඇති කරමින් සුළු පරිමාණ වශයෙන් කිරි ගව පාලනයේ නිරත වී ඇති අතර එම සතුන් කෘෂිකාර්මික කටයුතු වලදී මෙන්ම ආහාරයක් වශයෙන් කිරි සපයා ගැනීමේදී ද ගැමියාට උපකාරී විය. ඒ අනුව  ගොවීන් තම ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමේ අරමුණ ඇතිව සුළු පරිමාණයෙන් කිරි නිෂ්පාදනයේ නිරත වීම සිදු විය. එහිදී කිරි නිෂ්පාදනය කර්මාන්තයක් වශයෙන් ගෘහස්ථ ආර්ථිකයට දක්වන දායකත්වය ඇගයීම මෙම අධ්‍යයනය තුළ මුඛ්‍ය අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා කෑගල්ල දිස්ත්‍රික්කයේ දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් තුනකින් නියැදිය ලෙස කුටුම්භයන් 45 ක් තෝරා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේදී විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රමවේදය යටතේ වගු, ප්‍රස්තාර, රූප සටහන් හා සංඛ්‍යාලේඛන භාවිතා කරමින් විශ්ලේෂණය සිදු කර ඇත. නියැදියේ කිරි ගොවි පවුල් කෘෂිකර්මය හා වතු වගාවන්හි නිරත වන අතර ඉන් බහුතරයක්ම සත්ත්ව පාලනය ආශ්‍රිත ආර්ථික කටයුතු වල නිරත වීම දක්නට ලැබීම විශේෂත්වයකි. අධ්‍යයනයෙන්  නිගමනය කර ගැනීමට හැකි වූ ප්‍රධාන ප්‍රතිඵලයන් වශයෙන් දේශීය කිරි නිෂ්පාදන ක්‍රමාන්තය මූලික වශයෙන් ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමට දායක වන අතර සේවා වියුක්තිය/ඌන සේවා නියුක්තිය යන ගැටළු වලට ස්ථිරසාර විසඳුමක් ලෙසද ක්‍රියාත්මක වේ. එමෙන්ම මන්ද පෝෂණය අවම කිරීමත් ඒ තුළින් සෞඛ්‍ය සම්පන්න ශ්‍රම පිරිසක් බිහිකිරීම සඳහාත් දේශීය කිරි ක්‍රමාන්තය විශාල දායකත්වයක් දක්වනු ලබයි. තවද ජනතාවගේ ජීවන තත්ත්වය සමාජයේ උසස් තත්ත්වයකට පත් කිරීමට මෙන්ම කෘෂිකාර්මික අංශය තුළ පවතින ආදායම් ලැබීමේ අවිනිශ්චිතතාවයට වඩාත් යෝග්‍ය විසඳුමක් ලෙසද උසස් අධ්‍යාපනය ලැබූවන්ට පවා නිරත විය හැකි වඩාත් ලාභදායි ස්වයං රැකියාවක් වශයෙන් ද කිරි නිෂ්පාදන කර්මාන්තය ගෘහස්ථ ආර්ථිකය ශක්තිමත් කිරීමට විශාල දායකත්වයක් සපයා ඇති බව විද්‍යමාන වේ.



ප්‍රමුඛ පද: කිරි නිෂ්පාදන කර්මාන්තය, ගෘහස්ථ ආර්ථිකය, කෘෂිකාර්මික, ගොවීන්ගේ ජීවන තත්ත්වය, දායකත්වය


---


*1. සංවර්ධන අධ්‍යයනය, භූගෝල විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය , ශ්‍රී ලංකාව* harshiranasingha1991@gmail.com

*2.මහාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*